# රාසිං දෙයියන්ට බැණ වැදුණ මුරකරුවා - පාඩම ඇසුරින් ක්‍රියාකාරකම්

<u>ආවරණය වන නිපුණතා මට්ටම්</u>

5.1 වාක් කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි

11.1සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අද්දැකීම් ප්‍රකාශ කරයි.

12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි..

සිංහල භාෂාව හා සාහිත්‍යය

6 වැනි ශ්‍රේණිය

# ක්‍රියාකාරකම් අංක 01

- පාඩම කියවා පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1.මානකොළ කඩවත පිහිටියේ කවර නම් විහාරස්ථානය අසල ද?...............................

2.කඩවත යන පදයෙන් හඳුන්වන්නේ කුමක්ද?........

3.මානකොළ කඩවත මුර සේවාව භාරව සිටි තැනැත්තා කවුද?.................................

4.මුර පොළකින් ඔබ්බට යාමට නම් දැන සිටිම අවශ්‍ය වූයේ කුමක්ද? ...............................

5.රජු ගම් වැසියෙකුගේ වෙස් ගෙන ගියේ කොහේටද?...........................

6. හවඩියා දැඩි කෝපයට පත්වූයේ කුමක් නිසා ද?

..............................

7.හවඩියා  අවංකව රාජකාරි කිරීම නිසා ඔහුට ලැබුණේ මොනවාද?..................................

8.රජතුමාගේ චරිතයේ ඔබ දකින යහපත් ගුණාංග මොනවාද?...................................

9.හවඩියාගේ චරිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ ලියා දක්වන්න......................................

10.පහත යෙදුම්වල අදහස ලියන්න.

- දෙගිඩි දෙවාරු සිත -.............................
- සිංහාසනාරුඪ වූ ඒ මිහිපති තෙමේ-.............
- මහවාසල කරුණාව -...............................
- බල දානය කොට - ..................................

# ක්‍රියාකාරකම් අංක 02

- කතාව රසවත්ව ඉදිරිපත් කිරීම සඳහා යොදාගෙන ඇති රසවත් යෙදුම්(උපමා) සොයා ලියන්න.

1…………………………………………………………

2…………………………………………………………

3…………………………………………………………

4…………………………………………………………

# ක්‍රියාකාරකම් අංක 03

- දී ඇති උපකාරක පද ඇසුරු කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | 1 ආ | | 2 ර | |
| | 3 නි | | | | | |
| 4 ධෛ | | | ව | ත් | | 5 උ |
| | භී | | | | | |
| | | | 6 | වි | | ණ |
| | | | | | | |
| 7 ඔ | | තු | ක | | වෙ | |

# උපකාරක පද

- හරහට

2.භූපති යන්නට සමානාර්ථයක්

4.දිරිමත් යන්නෙහි සමානාර්ථයක්

6. දෙගුණ යන්නට සමානාර්ථ පදයක්.

7. චර පුරුෂයෙකු යන්නට සමානාර්ථයක්

පහළට

1.විධානය යන්නට සමානාර්ථ පදයක්.

3.අභීත යන්නට සමානාර්ථයක්

5.කුපිත යන්නට සමානාර්ථයක්.

# ක්‍රියාකාරකම් අංක 04

- පහත අවස්ථාව ඇසුරු කරගෙන නිර්මාණාත්මක රචනයක් ගොඩනගන්න.

"ඔබ මහත් ආශාවෙන් සිටි මුහුදු ගමනක යෙදීමේ අවස්ථාව ඔබට හිමි විය.නැව ඇත දියඹ තෙක් යාත්‍රා කෙරිණි.නො සිතූ ලෙස ඔබ ගමන්ගත් නැව ඉදිරි පසින් විශාල හිසක් සහිත සතෙකු මතු විය..."

# පිළිතුරු

- ක්‍රියාකාරකම් අංක 01

1.මොරපාය විහාරස්ථානය
2.මුරපොළ
3.හවඩියා
4.අවසර පදය
5.මානපොළ කඩවත පරීක්ෂා කිරීමට
6.රන්කාසියක් ලබා දී යාමට අවසර ඉල්ලූ විට
7.රජුගේ ඉණ පැලඳි රන් හවඩිය,රන්හවඩි දුර යන නාමය,රාජකීය ගම්වරයක්
8.තම සේවකයන්ගේ විශිෂ්ට සේවය අගය කිරීම
9.රජුට පක්ෂපාතී වීම,තම සේවය අවංකව යහපත්ව ඉටු කිරීම,මුදලට ගිජු නොවීම.
10 සිතේ දෙගිඩියාව
සිංහාසනයේ අසුන් ගත් ඒ රජු
රජුගේ අනුකම්පාව
බලය ලබා දී

## ක්‍රියාකාරකම් අංක 02

1.ගිරි ශිඛර වලා දුහුලින් සැරසුණු යෝධ පෙළක් මෙන්

2.එකින් එක පඩිපෙළක් මෙන් විහිදී ගිය

3.ගම්ගොඩවල් රැස සාගරය මැද පිහිටි දිවයින් මෙන්

4.දණ්ඩෙන් පහර ලත් සර්පයෙකු මෙන් කුපිත වී

## ක්‍රියාකාරකම් අංක 03

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | 1 ආ | | 2 ර | ජ |
| | 3 නි | | ඥා | | | |
| 4 ධෛ | ර් | ය | ව | ත් | | 5 උ |
| | හී | | | | | ර |
| | ත | | 6 ද් | වි | ගු | ණ |
| | | | | | | |
| 7 ඔ | ත් | තු | ක | රු | වෙ | කු |